# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

# සිංහල භාෂාව හා සාහිත්‍යය

නම/විභාග අංකය: ...............................................

| 11 ශ්‍රේණිය | III පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

**(I) උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**(II) 1,2,3,4 යන ප්‍රශ්නවලටත්, 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.**

**(III) මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

1. (I) සිට (X) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(I) " මේ ගම දැන් හොල්මන් අඩිකෝඩ පිරුණු යකුන් අරක් ගත් කාලකණ්ණි ගමකි."

(අ) මෙම කොටස උපුටා ගත් පාඩමේ නම ලියන්න.

(ආ) එම පාඩම ඇතුළත් කෘතියේ අනුවර්තකයා කවුද?

(II) " දේවයෙනි, මේ වේදේහ රජහුගේ බලයෙක් නොවෙයි, මහෞෂධ පණ්ඩිතයන්ගේ විධාන යැ ."

(අ) මෙහි සඳහන් වන ' දේවයෙනි ' යනු කවුරුන් ද ?

(ආ) ඉහත කොටස උපුටා ගත් කෘතිය නම් කරන්න.

(III) රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
<u>**මිණි බරණින්**</u> සැදූ මුත් ගත නොදිරද්ද
---------------------------------------------------

(අ) ඉහත කවියේ සිව්වෙනි පදය සම්පූර්ණ කරන්න.

(ආ) ඉරි ඇඳි පදයේ අර්ථය ලියන්න.

(IV) " ප්‍රේමවන්ත දරුවෙනි මා හිඳිනු කන් යොමා කියමි පුවත සැක දුරැරා අසන නිතියෙනා ."

(අ) මෙම ප්‍රකාශය කරන්නේ කවරුන් ද ?

(ආ) මෙහි සඳහන් ප්‍රේමවන්ත දරුවන් කවුද?

(V) " ඇපි අන්නට හිංසා නොකරන කුලෙහි උපන්නම්හ. එසෙ නොකට හැක්කැ."

(අ) මෙම කොටස උපුටා ගත් පාඩම නම් කරන්න.
(ආ) මෙහි නොකළ හැකි යැයි ප්‍රකාශ කරන්නේ කුමක්ද ?

(VI) " ඌරෝ ඇවිත් වටපිට කරති සක්මන්

වැටටත් උඩින් උන් අල්ලන **<u>මලක්කන්</u>** "

(අ) මෙහි සඳහන් වන ඌරන් වට පිට සක්මන් කරන්නේ ඇයි ?

(ආ) ඉරි ඇඳි පදයට අර්ථ සපයන්න.

(VII) " පුත, තෙල ලෙස කිරීම තොපටත් අපටත් තරම් නො වෙයි. "

(අ) ඉහත අවස්ථාව උපුටා ගත් කෘතිය නම් කරන්න.

(ආ) මෙහි සඳහන් වන 'පුතා' කවුරුන් ද ?

(VIII) " දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතුය

එහිත් සුවඳ මල් නිති වෙයි **<u>මිණි මුතුය</u>** "

(අ) ඉහත පද්‍ය කොටසේ නිර්මාණකරු නම් කරන්න.

(ආ) ඉරි ඇඳි පදයේ අර්ථය ලියන්න.

(IX) කෝට්ටේ රාජධානි යුගයේ දී රචනා වූ සංදේශ කාව්‍ය <u>නොවන</u> වෙනත් පද්‍ය කෘතීන් දෙකක් නම් කරන්න.

(X) " කැර පුද වඳින රැඳී මුනි සිරි පා තඹර

**<u>සකි සඳ</u>** පෙනේ සමනොළ ගල නැඟෙන හිර "

(අ) මෙහි සඳහන් රූපකයක් ලියන්න.

(ආ) ඉරි ඇඳි පදයට අර්ථ සපයන්න.

(ලකුණු 2× 10= 20 )

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(I) **<u>පිය සන් නොව</u>** බිඟු දැල් රැඳී කොපුලී

අවසන් නො ව වෙණ නදට ම **<u>කුහුලී</u>**

මද සන් සුන් පියොවින් සිටි නොසැලී

ගජ සෙන් සිතියම් ගජ සිරි කියෙලී

(අ) ඉරි ඇඳි පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(ආ) කවියෙන් මතු කරන මේ අවස්ථාව කෙටියෙන් හඳුන්වන්න.

(II) "මහතෙරුන් කුලගම් සිඟන්නට ගිය කලැ මිනිස්හු ඔවුන් දැකැ වෙවුලත් මැ යැ. පලත් මැ යැ. දොරපියා ලත් මැ යැ . ඇතැම්හු අඟුල්මල් නම අසමින් පලා **වලට** හො වදිති . ගෙට වැදැ දොර පියා ලා අගුළු හො ගන්ති. පලා නො යා හෙන්නාහු පිටි පෑ සිටුති. මහතෙරහු **සරළුවක්** හඹූ දු කෙණෙස්සක් බතු දූ නො ලැබෙති ."

(අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

(ආ) අඟුල්මල් තෙරුන් දුටු මිනිසුන් හැසුරුණු ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(III) දුටු සත සිතට තුටු වන ලෙසට නිතියෙනි

සතර ' ත එකට සම කර බෙර ඇසක් මෙනි

පැහැපත සුද නොහළ වැලි අතුළ මළු තැනි

මිහිකත සඳන' ලෙව් දුන් උර මඬල වැනි

(අ) ඉහත කවියෙහි අන්තර්ගත උපමා දෙකක් ලියන්න.

(ආ) සමස්ත කවියෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(IV) ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද

දත නැති දා උක් දඬු ගිනි තපින්ට ද

**වෙර නැති දා** ගහගත්තේ දිනන්ට ද

යුද ඇති දා නැති **කග** කොස් කොටන්ට ද

(අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

(ආ) "යුද ඇති දා නැති කග කොස් කොටන්ට ද " මෙය පැහැදිලි කරන්න.

(V) **" නටක විද්දතු** පන්සියයෙක් හවුරුද්දෙන් ස මසින් රජගහා නුවරට අවුදින් රජ්ජුරුවන්ට සතියක් මුළුල්ලෙහි **කෙළි පෑ** බොහෝ රත් රන් ලැබෙති."

(අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

(ආ) ඉහත කොටසෙහි අදහස ඔබේ වචනයෙන් ලියන්න.

( ලකුණු 4 ×5 = 20 )

- 3 හා 4 ප්‍රශ්න අනිවාර්ය වන අතර 5,6,7 ප්‍රශ්නවලින් **<u>එකකට පමණක්</u>** පිළිතුරු ලියන්න.

3. (අ) සංවාදශීලී බස් වහරක්

(ආ) කෙටි වැකි භාවිතයත් මඟින් 'අඟුල්මල් දමනය' කතාවෙහි තේමාව වඩාත් හොඳින් නිරූපණය වෙයි. එක කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන විචාරයක් කරන්න.

( ලකුණු 15)

**<u>නැතහොත්</u>**

(අ) ගොවියා මුහුණ දුන් අභියෝග සහ

(ආ) ජන කවියේ අපූරු භාෂාව කුරක්කන් කවි කෙරෙන් නිරූපණය වෙයි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන විස්තර කරන්න. .

(ලකුණු 15)

4. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **<u>දෙක</u>** බැගින් දක්වන්න.

(අ) කේවට්ට බමුණාගේ චරිතයත්

(ආ) මහෞෂධ පඬිතුමාගේ චරිතයත් සතර කන්මන්ත්‍රණය පාඩමේ නිරූපණය කර ඇති ආකාරය විමසන්න. ( ලකුණු 15)

**<u>නැතහොත්</u>**

(අ) අවස්ථා හා සිද්ධි නිරූපණයත්

(ආ) භාෂාව රසවත් ලෙස යොදා ගන්නා ආකාරයත් සිංහබාහු නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 )

5,6,7 ප්‍රශ්නවලින් **එකකට පමණක්** පිළිතුරු ලියන්න.

5. 'බැද්දේගම නවකතාවෙන් නිරූපණය වන්නේ නූගත් ගැමි ජනතාවගේ අව්‍යාජ සිතුම් පැතුම් ය' නිර්දිෂ්ට කොටස ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.

6. ස්වභාවික පරිසරයේ චමත්කාරය මනාව විශද කිරීමට සැළලිහිණි සංදේශ කතුවරයා දක්වන ශක්‍යතාව උදාහරණ තුනක් මගින් විස්තර කරන්න.

7. "ගංගාවේ සංගීතය " පද්‍ය නිර්මාණය ,මඟින් ගැඹුරු ජීවන දර්ශනයක් හෙළි කිරීමට නිර්මාණකරුවා සමත් වී ඇත. උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)